# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය

**ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් 2025 අගෝස්තු මස 19 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 ජූලි මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[**32** වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 101.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය

එල්.ඩී. - ඕ 33/2012

**ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක      දරන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම

**2.** (1) (මෙහි මින් මතු “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එහි සංස්ථාපිත නාමයෙන් නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

ආයතනයේ පරමාර්ථ

**3.** ආයතනයේ පරමාර්ථ-

(අ) නාය යෑම් නැඹුරුතාවක් ඇති ප්‍රදේශවල හෝ භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශයක, ඒවායේ අවබලපෑම අවම කිරීමේ සහ තිරසර ආකාරයෙන් එම ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, පර්යේෂණ සහ සමීක්ෂණ පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 2 වන වගන්තිය යටතේ සකස් කරන ලද ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ සකස් කරන ලද ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ වැඩ පිළිවෙළට අනුකූලව නාය යෑම් නැඹුරුතාවයක් ඇති ප්‍රදේශවල හෝ භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශයක ආපදා ප්‍රත්‍යාස්ථිතික වන ආකාරයකින් ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු කරගෙන යන බවට වගබලා ගැනීම සහ අදාළ තාක්ෂණික සහාය සැපයීම; සහ

(ඇ) ආපදා ප්‍රත්‍යාස්ථිතික නිර්මිත පරිසරයක් තහවුරු කිරීම උදෙසා අදාළ පර්යේෂණ සිදු කිරීම,

විය යුතු ය.

ආයතනයේ බලතල

**4.** ආයතනයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 2 වන වගන්තිය යටතේ සකස් කරන ලද ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ සකස් කරන ලද ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ වැඩ පිළිවෙළට අනුකූලව සුරක්ෂිත සංවර්ධන සහ ඉදිකිරීම් පරිචයන් පිළිබඳව, අදාළ බලධරයන් විසින් කරන ලද ඉල්ලීමක් මත එම බලධරයන්ට සහාය වීම;

(ආ) මේ පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව නාය යෑමේ අවදානම් තක්සේරු වාර්තාවේ හෝ භූ තාක්ෂණික ස්ථායිතා තක්සේරු වාර්තාවේ අනුකූලතාවය අධීක්ෂණය කර තහවුරු කිරීම සහ අනුකූලතා සහතිකය නිකුත් කිරීම;

(ඇ) නාය යෑමේ නැඹුරුතාවක් ඇති ප්‍රදේශ තුළ හෝ භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශ තුළ මිනිස් ජීවිතවලට, දේපළවලට සහ පරිසරයට අනතුරුදායක වන යම් ඉදිකිරීමේ හෝ සංවර්ධන කටයුත්තක දී අදාළ බලධරයන්ට සහාය වීම;

(ඈ) ආපදා අවදානම අවම කිරීමේ සැලසුම් සහ පරිචයන් සකස් කිරීම;

(ඉ) තාක්ෂණික උපදේශක කමිටු පත්කිරීම;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(උ) ආයතනයේ කටයුතු සඳහා අවශ්‍ය විශේෂඥ ඥානය, දැනුම, නිපුණතා සහ පළපුරුද්ද සහිත යම් තැනැත්තකු සේවයේ නියුක්ත කිරීම, කුලියට ලබා ගැනීම හෝ එම තැනැත්තාගේ සේවය ලබා ගැනීම;

(ඌ) ආයතනය විසින් සපයනු ලබන යම් සේවාවන් සඳහා ගාස්තු හෝ වෙනත් යම් ගෙවීම් අය කිරීම;

(එ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩල මගින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින් සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඒ) ශ්‍රී ලංකාවේ යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ජංගම, ඉතිරි කිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම;

(ඹ) ආයතනයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් උචිත යයි සිතන පරිදි එවැනි ආකාරයකින් යම් බැංකුවක සහ යම් මූල්‍ය ආයතනයක ආයෝජනය කිරීම;

(ඕ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ පරමාර්ථ ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි පරිදි යම් සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ක්‍රියාත්මක කිරීම; සහ

(ක) මණ්ඩලය විසින් බලය ලබා දෙනු ලැබිය හැකි පරිදි ආයතනයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට යෝග්‍ය විය හැකි හෝ ආනුෂංගික විය හැකි සියලු එකී ක්‍රියාවන් සහ දේවල් සිදු කිරීම.

**5.** ආයතනයේ කර්තව්‍ය- ආයතනයේ කර්තව්‍ය

(අ) නාය යෑම් අවදානම් කළමනාකරණය සඳහා ජාතික කේන්ද්‍රස්ථානයක් ලෙස 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ තාක්ෂණික ස්වභාවයේ කර්තව්‍යවල දී සහාය වීම;

(ආ) නාය යෑම් නැඹුරුතාවක් ඇති ප්‍රදේශ හෝ භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශ විමර්ශනය කිරීම, හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම සහ නැඹුරුතා මට්ටම් සීමාංකනය කිරීම සහ උපද්‍රව කලාප සිතියම් සකස් කිරීම;

(ඇ) පුද්ගලයන් ඉවත් කිරීමේ කාර්යය සඳහා නාය යෑම් අවදානම සහිත ප්‍රදේශයක් “නාය යෑමේ අනතුරු කලාපයක්” ලෙස හඳුනා ගෙන ප්‍රකාශයට පත් කිරීම;

(ඈ) නාය යෑම් හේතුවෙන් විභව්‍ය බලපෑම් ඇති විය හැකි ප්‍රදේශ සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම;

(ඉ) නාය යෑම් නැඹුරුතාවක් ඇති ප්‍රදේශයක සිදු කරන කවරාකාරයේ හෝ ඉදිකිරීම් හෝ සංවර්ධන කටයුත්තක් සඳහා නාය යෑමේ අවදානම් තක්සේරු වාර්තාව නිකුත් කිරීම;

(ඊ) නාය යෑම් පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන සිදු කිරීම සහ නාය යෑම් කෙරෙහි වන දේශගුණික විපර්යාස බලපෑම් අධීක්ෂණය කිරීම සහ නාය යෑම් ආශ්‍රිත අවදානම් අඩු කිරීම සඳහා අවම කිරීමේ ක්‍රමෝපායන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(උ) නාය යෑම හේතු කොට ගෙන සිදුවන සමාජයීය, ආර්ථික සහ පාරිසරික අවබලපෑම් අවම කිරීම සඳහා පූර්ව ක්‍රියාකාරී විද්‍යාත්මක විසඳුම් සැපයීම;

(ඌ) නාය යෑමේ නැඹුරුතාවක් ඇති ප්‍රදේශයක හෝ භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශයක ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමේ දී අදාළ බලධරයන්ට සහාය වීම;

(එ) භූමිය වැඩි දියුණු කිරීම පිළිබඳ සහ බෑවුම් ස්ථායිකරණ ක්‍රමෝපාය පිළිබඳ භූ තාක්ෂණික විමර්ශන සිදුකිරීම සහ තාක්ෂණික සේවාවන් සැපයීම;

(ඒ) භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශවල ඉදිකිරීම්වලට අදාළ පර්යේෂණ සිදු කිරීම සහ ඊට අදාළ තාක්ෂණික සහාය සැපයීම;

(ඔ) ඉංජිනේරු ශිල්පීයමය කාර්ය සඳහා භූ තාක්ෂණික විමර්ශනවල සහ සැලසුම්වල විෂය පථය නියම කිරීමට අමාත්‍යවරයාට නිර්දේශ සිදු කිරීම;

(ඕ) කැණීම් හෝ ඉදිකිරීම් සඳහා භූමි ස්ථාවරත්වය පිළිබඳ භූ තාක්ෂණික ස්ථායීතා තක්සේරු වාර්තා නිකුත් කිරීම;

(ක) භූ තාක්ෂණික විමර්ශනවලට අදාළ සියලු තොරතුරුවල සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම;

(ග) ආපදා ප්‍රත්‍යාස්ථිතික ඉදිකිරීම් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සහ ඊට අදාළ තාක්ෂණික සහාය සැපයීම;

(ච) අදාළ තාක්ෂණික විසඳුම් සැපයීම සඳහා පරිසරයේ ඇති වන රසායනික, භෞතික සහ ජීවවිද්‍යාත්මක වෙනස්වීම් තක්සේරු කිරීම;

(ජ) ගොඩනැඟිල්ලේ පදිංචිකරුගේ හෝ අයිතිකරුගේ ඉල්ලීම මත ව්‍යුහය, පදිංචිය, ශක්තිය සහ පරිසරය මත පදනම්ව ගොඩනැඟිල්ල තක්සේරු කිරීම සහ තාක්ෂණික සහාය සැපයීම;

(ට) ඉදිකිරීම් කාර්ය සඳහා භාවිත කරන ලද අමුද්‍රව්‍ය, නිෂ්පාදන, තාක්ෂණය සහ ඒවායේ යෝග්‍යතාව පිළිබඳ පර්යේෂණ සිදු කිරීම;

(ඩ) ගොඩනැඟිල්ලක පදිංචිකරුවාගේ හෝ අයිතිකරුවාගේ ඉල්ලීම් මත ගොඩනැඟිලිවල සහ ව්‍යුහයන්ගේ හානිවල තත්ත්වය, ආරක්ෂාව පිළිබඳව සහ ආපදා ප්‍රත්‍යාස්ථිතික සැලසුම් සහ ඉදිකිරීම් ගුණාංග ගොඩනැඟිලි සහ ව්‍යුහයන්ට ඇතුළත් කිරීම පිළිබඳව විමර්ශනය කිරීම සහ ව්‍යුහාත්මක සුරක්ෂිතතාවය පිළිබඳ තාක්ෂණික විසඳුම් සැපයීම;

(ණ) අදාළ බලධරයන් විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, ඉදිකිරීමක සහ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, පිරිවිතර සහ ප්‍රමිතීන් සංවර්ධනය කිරීමේ දී එම අදාළ බලධරයන්ට සහාය සැපයීම;

(ත) දැනුම්වත්භාවය ඇති කිරීම, පුහුණුව සහ තාක්ෂණ හුවමාරුව තුළින් ආයතනය විශේෂඥ ඥානය දක්වන

ක්ෂේත්‍රයන් හි විද්‍යාත්මක දැනුම සහ තොරතුරු පතුරුවා හැරීම; සහ

(ද) මණ්ඩලයේ අනුමතයට යටත්ව, පර්යේෂණ සහ සමීක්ෂණ පැවැත්වීමේ දී දේශීය සහ ජාත්‍යන්තර අදාළ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ රැස් කරන ලද දත්තවල රහස්‍යභාවය පවත්වා ගනිමින් සහ පේටන් අයිතිවාසිකම් සම්බන්ධ ලිඛිත නීතිවලට යටත්ව එම පර්යේෂණ සහ සමීක්ෂණවල ප්‍රතිඵල පතුරුවා හැරීම,

විය යුතු ය.

II වන කොටස

**ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය**

ආයතනයේ පාලක මණ්ඩලයේ සංයුතිය

**6.** (1) ආයතනයේ කටයුතුවල පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු (මේ පනතේ “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ පාලක මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය:-

(අ) නිලබලයෙන් පත් වන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්, එනම්:-

(i) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ආපදා කළමනාකරණය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයාගේ ධුරයට පහළ ධුරයක නොවන ඔහුගේ අනුයෝජිතවරයකු;

(iii) පළාත් පාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයාගේ ධුරයට පහළ ධුරයක නොවන ඔහුගේ අනුයෝජිතවරයකු;

(iv) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ පිහිටුවන ලද ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(ආ) (මෙහි මින් මතු ''පත් කරන ලද සාමාජිකයන්'' ලෙස සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කළ යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්, එනම්:-

(i) නිවාස විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ආපදා ප්‍රත්‍යාස්ථිතිය ක්ෂේත්‍රයේ වසර පහකට නොඅඩු පළපුරුද්දක් සහ ඉංජිනේරු ශිල්පය, භූ විද්‍යාව, පාරිසරික විද්‍යාව, වාස්තු විද්‍යාව හෝ නාගරික සංවර්ධනය යන විෂයයන්වලින් එක් විෂයයක් හෝ ඊට වැඩි විෂයයන් ගණනක පශ්චාත් උපාධි සුදුසුකම් සහිත එක් තැනැත්තකු;

(ii) ඉංජිනේරු ශිල්පය, භූ විද්‍යාව, පාරිසරික විද්‍යාව, වාස්තු විද්‍යාව හෝ නාගරික සංවර්ධනය යන විෂයයන්වලින් එක් විෂයයක හෝ ඊට වැඩි විෂයයන් ගණනක පශ්චාත් උපාධි සුදුසුකම් දරන විද්වත් තැනැත්තන් අතරින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද එක් විද්වත් තැනැත්තකු; සහ

(iii) 2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනත යටතේ සංස්ථාගත කරන ලද

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් නම් කරන ලද ඉංජිනේරු ශිල්පය, භූ විද්‍යාව, පාරිසරික විද්‍යාව, වාස්තු විද්‍යාව හෝ නාගරික සංවර්ධනය යන විෂයයන්ගෙන් එක් විෂයයක හෝ ඊට වැඩි විෂයයන් ගණනක පශ්චාත් උපාධි සුදුසුකම් දරන දේශීය භූ තාක්ෂණික ඉංජිනේරු ශිල්පයේ හෝ ගොඩනැඟිලි ඉදිකිරීම් කර්මාන්තයේ විශේෂඥ ඥානය සහිත එක් විද්වත් වෘත්තිකයකු.

(2) මේ පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරන ලද ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය භාවිත කිරීම සඳහා හිමිකම නොලබන්නේ ය.

(3) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනත මගින් ආයතනයට ප්‍රදානය කරන ලද, පවරන ලද හෝ පනවන ලද බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා වන නුසුදුසුකම්

**7.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකු වීම අවසන් කර ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට සොයාගෙන හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව

ඇති බවට ප්‍රකාශ කරනු ලැබ වස්තුබංගත්වයෙන් හෝ බුන්වත්භාවයෙන් නිදහස් කර නොමැති නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ විඳිමින් සිටිනු ලැබ ඇත්නම්;

(ඊ) ආයතනය මගින් හෝ ආයතනය වෙනුවෙන් සිදු කරන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ බුක්ති විඳින්නේ නම්; හෝ

(උ) මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ඔහු විසින් ඔහුගේ කර්තව්‍ය කිරීමේ දී බලපෑම් විය හැකි පරිදි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා ඇත්නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස අඛණ්ඩව සිටීමට නුසුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුරකාලය

**8.** මණ්ඩලයේ පත්කරන ලද සෑම සාමාජිකයකු ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත්කිරීම නිසා ඔහු විසින් ධුරය කලින් හිස් කර ඇත්නම් මිස, ඔහුගේ පත් වීමේ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය.

පත්කරන ලද සාමාජිකයන්ගේ ධුරය හිස් කිරීම

**9.** (1) යම් පත්කරන ලද සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) යම් පත්කරන ලද සාමාජිකයකු-

(අ) 7 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් නුසුදුසුකමකට යටත්ව ඇත්නම්;

(ආ) යම් කායික අශක්නුතාවයක් හෝ සිහිවිකල වීමක් හේතුවෙන් ඔහුගේ කාර්ය ඉටු කිරීමට ස්ථිරව ම

අපොහොසත් වී ඇති බව අමාත්‍යවරයාගේ මතය වේ නම්; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ මතය අනුව ආයතනය අපකීර්තියට පත් විය හැකි යම් ක්‍රියාවක් ඔහු විසින් සිදු කරන්නේ නම්,

අමාත්‍යවරයා විසින් එම පත්කරන ලද සාමාජිකයා අමතා යවන ලිඛිත නිවේදනයක් මගින් එම පත්කරන ලද සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලිඛිත සන්නිවේදනයකින් අමතනු ලබන්නේ යම් පත්කරන ලද සාමාජිකයකු ද එම පත්කරන ලද සාමාජිකයා විසින් එම සන්නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ ධුරය හිස් කළ යුතු ය.

(4) ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති යම් පත්කරන ලද සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත්කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් ආයතනයට සේවය කිරීම සඳහා සුදුසුකම් නොලබන්නේ ය.

(5) යම් පත්කරන ලද සාමාජිකයකු විසින් ධුරය හිස් කිරීමේ දී අමාත්‍යවරයා විසින්, මේ පනතේ 6 වන වගන්තියේ දක්වා ඇති සුදුසුකම් දරන යම් සුදුසු තැනැත්තකු එම පුරප්පාඩුව පිරවීමට පත් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන්නා වූ පත්කරන ලද සාමාජිකයාගේ නොගෙවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(6) යම් පත්කරන ලද සාමාජිකයකුට අසනීප තත්ත්වයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් එම සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට මේ පනතේ 6 වන වගන්තියේ දක්වා ඇති සුදුසුකම් දරන යම් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

**මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික**

**10.** මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එකී අනුප්‍රමාණවලින් එකී පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

**මණ්ඩලයේ රැස්වීම්වල දී ගණපූරණය**

**11.** (1) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය හතර දෙනෙකු විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම්වලදී කටයුතු කරගෙන යාම සඳහා වන ක්‍රියාපටිපාටිය මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී උද්ගතවන යම් ගැටලුවක් පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය මගින් නිශ්චය කරනු ලැබිය යුතු අතර ඡන්ද සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට දෙවන හෝ තීරක ඡන්දයක් පැවතිය යුතු ය.

(4) මණ්ඩලයේ පුරප්පාඩුවක් පැවතිය ද එය නොසලකා, මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සකස් කිරීමට මණ්ඩලයේ සාමාජිකයන් ප්‍රමාණය ප්‍රමාණවත් වන තාක් දුරට, මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබිය හැකි ය.

**යම් ඉඩමකට ඇතුළු වී සෝදිසි කිරීමට මණ්ඩලයේ බලතල**

**12.** (1) මේ පනතේ කාර්ය සඳහා, මණ්ඩලයේ සාමාජිකයකු හෝ මණ්ඩලය විසින් ලිඛිතව බලය පවරන ලද තාක්ෂණ නිලධරයකුගේ ධුරයට වඩා පහළ ධුරයක නොවන නිලධරයකු විසින් ඉඩමක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් කරන ලද ඉල්ලීමක් මත එම ඉඩමට ඇතුළු විය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මණ්ඩලයේ සාමාජිකයකු හෝ මණ්ඩලය විසින් ලිඛිතව බලය පවරන ලද තාක්ෂණික නිලධරයකුගේ ධුරයට වඩා පහළ ධුරයක නොවන නිලධරයකු විසින් නාය යෑමේ ආසන්නතම අවදානමක් ඉඩමක පවතින බවට එම සාමාජිකයා හෝ නිලධරයා ඉදිරියේ ඇති වැදගත් කරුණුවලින් සෑහීමට පත්වන අවස්ථාවක,

එම සාමාජිකයා හෝ නිලධරයා එම ඉඩමේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ එකඟත්වය ඇතිව පොලිස් නිලධරයකු සමඟ එම ඉඩමට ඇතුළු වීම නීත්‍යනුකූල වන්නේ ය.

(3) සාමාජිකයා හෝ නිලධරයා විසින් අවශ්‍ය වාහන, උපකරණ හෝ ආම්පන්න සහිතව හෝ රහිතව යම් ඉඩමකට ඇතුළු වීමෙන් අනතුරුව එම ඉඩම පරීක්ෂා කර යම් පස් සාම්පලයක් ගැනීම හෝ එම ඉඩම තුළ යම් ඇගයීමක් හෝ පරීක්ෂණයක් සිදු කිරීම කළ හැකි ය.

(4) එම ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් (1) වන උපවගන්තියේ සඳහන් කළ සාමාජිකයාට හෝ නිලධරයාට සියලු සාධාරණ සහාය ලබා දිය යුතු ය.

මණ්ඩලයේ බලතල පැවරීම

**13.** (1) මණ්ඩලය විසින්, ලිඛිතව නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එකී කොන්දේසිවලට යටත්ව, 4 වන වගන්තියේ (ඉ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ), සහ (ක) වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලතල හැර මණ්ඩලයේ බලතල කිසිවක්, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ සභාපතිවරයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට. තාක්ෂණික උපදේශක කමිටුවට හෝ 4 වන වගන්තියේ (උ) වන ඡේදයේ සඳහන් කරන ලද යම් තැනැත්තකුට පවරනු ලැබිය හැකි අතර සභාපතිවරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, තාක්ෂණික උපදේශක කමිටුව හෝ 4 වන වගන්තියේ (උ) වන ඡේදයේ සඳහන් කරන ලද යම් තැනැත්තකු විසින් එම බලතල මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක් නොසලකා, එසේ පවරන ලද යම් බලතල කිසිවක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයාගේ විධාන යටතේ මණ්ඩලය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය කිරීම

**14.** අමාත්‍යවරයා විසින්, කලින් කල, මේ පනත යටතේ මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ කිරීමට අදාළව එකී සාමාන්‍ය හෝ විශේෂ විධාන මණ්ඩලයට නිකුත් කරනු ලැබිය හැකි ය. එම විධානවලට අනුකූල වීම මණ්ඩලයේ කාර්ය වන්නේ ය.

**15.** ආයතනයේ මුද්‍රාව-

ආයතනයේ මුද්‍රාව

(අ) මණ්ඩලය විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එකී තැනැත්තකු භාරයේ තැබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එකී ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඔවුන් පැමිණ සිටින බවට සංකේතයක් ලෙස ඔවුන් දෙදෙනා ම අත්සන් කළ යුතු ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හැර කිසිදු ලේඛනයකට හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය.

III වන කොටස

**ආයතනයේ කාර්ය මණ්ඩලය**

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

**16.** (1) සුදුසුකම් සහ පළපුරුද්ද නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ඉංජිනේරු ශිල්පය, විද්‍යාව හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතාවයක් ලබා ගෙන ඇති තැනැත්තන් අතරින් ආයතනයේ කාර්ය මණ්ඩලයට (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප්, රජයේ අදාළවන මාර්ගෝපදේශවලට අනුකූලව මණ්ඩලය විසින් මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මණ්ඩලයේ සාමාන්‍ය විධානයට යටත්ව, ආයතනයේ නිලධරයන්ගේ සහ

සේවානියුක්තයන්ගේ පරිපාලනය සහ කළමනාකරණය ඇතුළුව ආයතනයේ කටයුතු කළමනාකරණය සඳහා වගකිව යුතු ය.

(5) (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය දරන තැනැත්තා විසින්, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් එම තැනැත්තා විසින් එම ධුරය හිස් කරනු ලැබ ඇත්නම් මිස, විශ්‍රාම යාමේ වයස තෙක් එම ධුරය දරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින්, විශ්‍රාම යාමේ වයස රජයේ අදාළ වන මාර්ගෝපදේශවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින්, ඒ සඳහා හේතු දක්වා, අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය (5) වන උපවගන්තිය යටතේ මියයාමෙන්, ඉවත් කිරීමෙන් හෝ ධුරයෙන් විශ්‍රාම යාමෙන් හෝ අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වන්නේ ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් සිදු වන අවස්ථාවක, එම පුරප්පාඩුව පිරවීමට (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් සිදු කරනු ලබන තෙක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ කිරීමට අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ආයතනයේ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ බලතල හෝ කර්තව්‍ය පැවරිය හැකි බව

**17.** අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එසේ කිරීමට අවශ්‍ය යයි ඔහු සලකා බලනු ලබන අවස්ථාවක, මණ්ඩලයේ අනුමතය ඇතිව මේ පනත මගින් ඔහු වෙත පවරා ඇති යම් බලතලයක් හෝ කර්තව්‍යයක් ආයතනයේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර එම නිලධරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානයට සහ පාලනයට යටත්ව එම බලතලය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සහ කිරීම කළ යුතු ය:

එසේ වුව ද, 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවරන ලද බලතලයක් හෝ කර්තව්‍යයක් මේ වගන්තිය යටතේ පවරනු නොලැබිය යුතු ය.

**ආයතනයේ අධ්‍යක්ෂවරයන්**

**18.** (1) ආයතනයේ වෙන් වෙන් වූ අංශ භාරව සිටිය යුතු ආයතනයේ අධ්‍යක්ෂවරයන් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි ය. එකී සේවා නියුක්තියේ නියම සහ කොන්දේසි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයන් විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කලින් කල, පවරන ලද ඔවුන්ගේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරිම සහ කිරීම කළ යුතු ය.

**නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කිරිම**

**19.** (1) මණ්ඩලය විසින්. ආයතනයේ බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සහ කිරීමට අවශ්‍ය විය හැකි පරිදි එකී නිලධරයන් හෝ අනෙකුත් සේවානියුක්තයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ පාරිශ්‍රමික, සුදුසුකම් නිර්ණායක සහ බඳවා ගැනීමේ පරිපාටිය ඇතුළුව සේවා නියුක්තියේ නියම සහ කොන්දේසි රජයේ අදාළවන මාර්ගෝපදේශ අනුව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) කෙසේ වුව ද, යම් තැනැත්තකු, එම තැනැත්තා විසින් රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ කලින් දරන ලද යම් තනතුරකින් නෙරපා හරිනු ලැබ ඇත්නම්, මණ්ඩලය විසින් එම තැනැත්තා ආයතනයේ නිලධරයකු ලෙස හෝ සේවානියුක්තයකු ලෙස පත් නොකළ යුතු ය.

**ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරිම**

**20.** (1) ආයතනයේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එකී කාලසීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව

පත් කරනු ලැබිය හැකි ය; එවැනිම කැමැත්ත ඇතිව ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත්කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරන ලද අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරන ලද අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) රජය සමඟ ගිවිසුමකට එළඹ එම ගිවිසුම මගින් යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට එකඟ වී ඇති රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනය විසින් සේවයේ යොදවන අවස්ථාවක, එම නිලධරයා විසින් ආයතනයට සේවය කළ යම් කාලසීමාවක් එම ගිවිසුමේ වගකීම ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## මුදල්

**21.** (1) ආයතනයට ස්වකීය අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදලට-

ආයතනයේ අරමුදල්

(අ) ආයතනය විසින් එහි බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ කිරීමේ දී ආයතනයට ලැබිය හැකි පරිදි සියලු මුදල් ප්‍රමාණය; සහ

(ආ) 4 වන වගන්තියේ (එ) වන ඡේදය ප්‍රකාර ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව යම් මූලාශ්‍රයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන ආකාරයෙන්

ආයතනයට ලැබිය හැකි පරිදි සියලු මුදල් ප්‍රමාණය,

බැරකරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ආයතනයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ කිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය කරන එවැනි සියලු මුදල් ප්‍රමාණය ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**22.** (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආයතනය විසින්, ආයතනයේ ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ වෙනත් සියලු මූල්‍ය ගනුදෙනුවල නිසි ගිණුම් පොත් තබා ගැනීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම

**23.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන ආයතනයේ මුදල් පාලනය සහ ගිණුම් සඳහා සහ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

## V වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා ආදිය නිකුත් කිරීම

**24.** (1) යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් මත අයතනය විසින් නාය යෑම් අවදානම් තක්සේරු වාර්තාව හෝ භූ තාක්ෂණික ස්ථායිතා තක්සේරු වාර්තාව නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ වාර්තාවේ අනුකූලතාවය අධීක්ෂණය කරන ලෙස යම් අදාළ බලධරයකු විසින්, ආයතනයෙන් ඉල්ලා සිටින අවස්ථාවක, ආයතනය

විසින් එම වාර්තාවේ අනුකූලතාවය පිළිබඳ අධීක්ෂණය කර, ඒ පිළිබඳව එම අදාළ බලධරයාට වාර්තා කළ යුතු අතර අනුකූලතා සහතිකයක් නිකුත් කළ යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා ඉඩමක් හෝ ඉඩමක පරවශතාව අත්කර ගැනීම

**25.** (1) මේ පනත යටතේ පිහිටුවන ලද ආයතනයේ කාර්යාලයක් ඉදිකිරීමේ හෝ පවත්වාගෙන යාමේ අරමුණ සඳහා ආයතනයට යම් ඉඩමක් හෝ ඉඩමක යම් පරවශතාවයක් හෝ අවශ්‍ය වන අවස්ථාවක, එම අරමුණ (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්යය සඳහා පොදු අරමුණක් ලෙස සලකනු ලැබිය යුතු අතර, රජය විසින් එම ඉඩම හෝ එම ඉඩමේ පරවශතාවය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා අත්කර ගත හැකි ය. ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන එම අත්කර ගැනීම සඳහා සහ එම අත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා එම ඉඩම හෝ පරවශතාවය අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) රජයේ යම් ඉඩමක් ආයතනයේ කාර්යය සඳහා අවශ්‍යවන අවස්ථාවක, එම කාර්යය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් අඥාපනතේ 6 වන වගන්තිය යටතේ කරනු ලැබිය හැකි එම දේපළේ විශේෂ ප්‍රදානයක් හෝ බද්දට දීමක් සඳහා වන කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, එම ආඥාපනතේ විධිවිධාන එම දේපළේ විශේෂ ප්‍රදානය හෝ බද්ද සඳහා අදාළ කරගනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තාව

**26.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එක් එක් ලිත් වර්ෂය අවසානයේ මාස හයක් ඇතුළත එම වර්ෂය අතරතුරේ දී ආයතනයේ කටයුතුවල සම්පූර්ණ තොරතුරු ලබා දෙන වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාරදිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, එම වාර්තාව ලැබුණ දින සිට මාස තුනක් ඇතුළත එම වාර්ෂික වාර්තාවේ පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, කලින් කල, එම වාර්ෂික වාර්තාවට ඇතුළත් කරනු ලැබිය යුතු කාරණා හෝ තොරතුරු නිශ්චිතව දැක්විය හැකි ය.

මණ්ඩලයේ සියලු සාමාජිකයන් ආදිය රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**27.** මණ්ඩලයේ සියලු ම සාමාජිකයන්, ආයතනයේ නිලධරයන් සහ සේවා නියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය

**28.** ආයතනය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

වියදම් ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු බව

**29.** (1) යම් අධිකරණයක් ඉදිරියේ ආයතනය විසින් හෝ ආයතනයට එරෙහිව ගෙන එනු ලබන යම් නඩු කටයුත්තක දී ආයතනය විසින් දරන ලද සියලු වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් නඩු කටයුත්තක දී ආයතනයට ගෙවන ලද හෝ ආයතනය විසින් අය කර ගත් මුදල් පමණක් ආයතනයේ අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරයකු, ආයතනයේ යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ අමාත්‍යවරයාගේ හෝ මණ්ඩලයේ විධානය මත එම තැනැත්තා විසින් කරන ලද හෝ කරන ලද බවට උද්දේශාය යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ එම තැනැත්තා විසින් හෝ එම තැනැත්තාට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එම තැනැත්තා දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව කරනු ලැබුවේ සද්භාවයෙන් යයි අධිකරණය පිළිගන්නේ නම්, එම තැනැත්තා විසින් එම සිවිල් හෝ අපරාධ නඩුවෙන් එම වියදම් අය කරගෙන ඇත්නම් මිස, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් විය යුතු බව

**30.** මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කිරීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක්

සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම යටත් විය යුතු ය.

නියෝග

**31.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ මේ පනත මගින් නියමිත යයි නියම කරන යම් කාරණාවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරනු ලබන දින සිට හෝ නියෝගයක් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් පසු දිනක සිට බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබිය යුතු ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ වන බලපත්‍රලාභී යම් බැංකුවක් අදහස් වේ;

"ගොඩනැඟිලි" යන්නෙන්, මිනිස් පදිංචිය සඳහා නිවසක්, මහල් නිවාසයක් හෝ සහාධිපත්‍ය දේපළක් ලෙස ඉදිවෙමින් පවතින, අර්ධ වශයෙන් ඉදිකරන ලද

හෝ සම්පූර්ණයෙන් ඉදිකරන ලද ව්‍යුහයක් හෝ ආපදා කළමනාකරණයේ දී භාවිත කරන පදිංචිව සිටින හෝ හිස්ව පවතින තත්වයක ඉවත් වීමේ මධ්‍යස්ථානයක් හෝ නැවත පදිංචි කිරීම සඳහා වූ නිවසක් හෝ පාසලක්, අධ්‍යාපන ආයතනයක්, හෝටලයක්, කාර්යාලයක්, ශාලාවක්, පූජනීය ස්ථානයක්, සාප්පුවක්, සාප්පු සංකීර්ණයක්, කර්මාන්ත ශාලාවක් හෝ වාණිජ සම්බන්ධතා ඇති ගබඩාවක් හෝ සාමාන්‍ය ජනතාව රැස්විය හැකි වෙනත් යම් සමාන ස්ථානයක් ඇතුළත් වේ;

“පූර්ව අනතුරු ඇඟවීම්” යන්නෙන්, උපද්‍රවයක් මගින් තර්ජනයට පත් පුද්ගලයන්ට සහ ප්‍රජාවට විය හැකි පීඩා හෝ හානි අවම කිරීමට උචිත ලෙස සහ ප්‍රමාණවත් කාලයක් තුළ දී සූදානම්වී ක්‍රියා කිරීමට හැකියාව ඇති කරවීම සඳහා කාලීන සහ වැදගත් අනතුරු ඇඟවීමේ තොරතුරු කාලෝචිතව සකස් කර ප්‍රචලිත කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ;

“මූල්‍ය ආයතන” යන්නෙන්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී ආයතනයක් අදහස් වේ;

“භූ තාක්ෂණික අස්ථාවරත්වය” යන්නෙන්, අභ්‍යන්තර පස් තට්ටුවල සංයුතියේ තත්ත්වයන් හෝ පාරිසරික තත්ත්වයන් වෙනස් වීම හේතුවෙන් සාපේක්ෂ අඩු පීඩන තත්ත්වයන් යටතේ ප්‍රසාරණය වීමට, බිඳ වැටීමට, විසරණය වීමට හෝ අධික ලෙස ගොඩනැඟිලි ගිලා බැසීමට ඇති විභවය සහ ඒ මත ගොඩනගා ඇති ගොඩනැඟිලි සහ ව්‍යුහයක් අසාර්ථක වීමට හේතු වන යම් අභ්‍යන්තර පස් තට්ටුවල ඇති වන අස්ථාවරත්වය අදහස් වේ;

“භූ තාක්ෂණික ස්ථායිතා තක්සේරු වාර්තාව” යන්නෙන්, අදාළ වැඩබිමට යාබද දේපළවලට සහ යෝජිත සංවර්ධනයට අහිතකර බලපෑමක් ඇති විය හැකි

ගැඹුරු කැණීම්, භූගත කැණීම්, භූමි වැඩි දියුණු කිරීම් කාර්ය, රැඳවුම් ව්‍යුහයන් හෝ ආධාරක ව්‍යුහ ඉදිකිරීමේ කාර්ය සම්බන්ධ යම් ඉදිකිරීමක් හෝ සංවර්ධන කටයුත්තක් සම්බන්ධයෙන් භූමියේ ආනතිය, භූ විද්‍යාත්මක සහ භූ තාක්ෂණික නෛසර්ගික ලක්ෂණ, භූ විද්‍යාත්මක හැඩගැසීම්, පාෂාණ අසම්බන්ධතා ලක්ෂණ, භූගත ජලයේ හැසිරීම, මතුපිට ජලය නිශ්චලනය මගින් වන විභවය සහ ජලය ඉවත් කිරීමෙන් වන බලපෑම පිළිබඳ භූ තාක්ෂණික ඇගයීමට යටත්ව නිකුත් කරන භූ තාක්ෂණික ස්ථායිතාවයේ බලපෑම්වලට අදාළ ලේඛනයක් අදහස් වන අතර, එයට අවශ්‍ය කොන්දේසි, මාර්ගෝපදේශ, තාක්ෂණික උපදේශ සහ සුදුසු යයි සිතිය හැකි පරිදි අවමකරණ ක්‍රමවේද ද ඇතුළත් වේ;

“උපද්‍රව්‍ය කලාප සිතියම” යන්නෙන්, උපද්‍රවවලට නැඹුරුතාවයක් දක්වන ප්‍රදේශයක් හඳුනා ගනිමින් නැඹුරුතාවයේ විවිධ මට්ටම් සහිත කලාප දක්වමින් සකස් කරන ලද සිතියමක් අදහස් වන අතර ඊට අමතරව අදාළ ආපදාවට සම්බන්ධිත තොරතුරු, එනම් ඉවත්වීමේ මාර්ගවල සහ සුරක්ෂිත මධ්‍යස්ථානවල දළ සටහනක්, ආපදා සිදු වීමේ සම්භාවිතාව සහ හැකියාව පිළිබඳ අගැයීම, අනතුරු ඇඟවීම් සහ ඉවත් වීමේ ක්‍රමවේදය, ජනාවාස ව්‍යාප්තිය සහ ආපදාවලට අදාළ වෙනත් මූලික තොරතුරු ආදිය ඇතුළත් විය හැකි ය;

“නාය යෑම” යන්නෙන්, මානව ක්‍රියාකාරකම් හෝ ස්වභාවික හේතූන් නිසා සිදු වී ඇති හෝ සිදු විය හැකි ගිලා බැසීම් ඇතුළුව යම් ආකාරයක ස්කන්ධ චලනයන් අදහස් වේ;

“නාය යෑමේ අනතුරු කලාප” යන්නෙන්, වහා සිදු වන්නට යන නාය යෑමේ ආපදාවකට යටත්වන නිශ්චිත ප්‍රදේශයක පුද්ගලයන්ගේ ජීවිත අනතුරට භාජනය

විය හැකි හෝ අනතුරු හා දේපළ හානි සිදු කළ හැකි මානව ගැවසීම් ඇතුළුව බැහැර කිරීමේ කලාපය තුළ සිදු විය හැකි ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා ආයතනය විසින් නිශ්චිත කාලසීමාවක් සඳහා ප්‍රකාශයට පත් කරන ලද බැහැර කිරීමේ කලාපයක් අදහස් වේ;

‘‘නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා’’ යන්නෙන්, නාය යෑමේ නැඹුරුතාවක් ඇති ප්‍රදේශයක යම් ඉදිකිරීමක් හෝ සංවර්ධන ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් නිකුත් කළ ලේඛනයක් අදහස් වන අතර, සුදුසු වන පරිදි අවශ්‍ය මාර්ගෝපදේශ, තාක්ෂණික උපදෙස් සහ අවම කරන ක්‍රමවේදයක් ද ඇතුළත් වේ;

‘‘අමාත්‍යවරයා’’ යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ; සහ

‘‘අදාළ බලධරයන්’’ යන්නෙන්, සියලු ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතන සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනා අනුමත කිරීමට බලගන්වන ලද ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජ්‍යායතන ඇතුළත් වේ.

ඉතිරිකිරීම

**33.** (1) (2007 අප්‍රේල් මස 4 වන දින අංක 07/0435/343/002 දරන අමාත්‍ය මණ්ඩලය තීරණය) අමාත්‍ය මණ්ඩලය තීරණයට අනුව පිහිටුවන ලද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මේ පනත ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ සේවයේ නියුක්ත සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට ඔවුන්ගේ අදාළ විශ්‍රාම යාමේ වයසට එළඹ නොමැති එම සංවිධානයේ සියලු ම නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට මේ පනත ක්‍රියාත්මක වන

දිනයට පෙරාතුව ම දිනයේ ඔවුන්ට අදාළ වන සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා සතුටුදායක භාවයෙන් අඩු නොවන නියම සහ කොන්දේසි මත මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි ආයතනයේ සේවා නියුක්තිය පිරිනැමිය යුතු ය.

(ආ) ආයතනයේ සේවා නියුක්තිය තෝරා ගැනීමට අරමුණු කරන (අ) වන ඡේදයේ සඳහන් කරන ලද යම් නිලධරයකු සහ සේවානියුක්තයකු විසින් ඔහුට ආයතනයේ සේවා නියුක්තිය පිරිනමන ලද දින සිට මාස හයක් ඇතුළත එය භාරගත හැකි ය.

(ඇ) (ආ) වන ඡේදයේ සඳහන් කළ පරිදි යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු එකී පිරිනැමීම පිළිනොගැනීමේ ඔහුගේ තීරණය ක්‍රියාත්මක කරන්නේ නම්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව තත්කාර්ය සඳහා ක්‍රියාත්මක කළ යුතු ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් යටතේ ඔහුට වන්දි ගෙවීම කළ යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**34.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.